# බළන්ගොඩ නගර සභාව

## 2019-11-11 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.11.11**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව හා සම්මත කිරීම.**

අද දින මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගනිමින් 2019-11-11 වන දින මාසික මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමා, 2019-10-08 දින පැවති මහ සභාවේ හා 2019-10-18 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් 2019-10-08 දින පැවති මහ සභාවේ හා 2019-10-18 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා සත්‍යය වාර්තා සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාව සඳහා සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විමසා සිටි අවස්ථාවේ දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් නව බස්නැවතුම්පළ රජයේ ප්‍රතිපත්ති අනුව ටෙන්ඩර් කර ඉන් කෝටි නවයක ආදායමක් ලැබූ අතර දේශිය ණය සංවර්ධන අරමුදල වෙත කෝටි දෙකක මුදලක් ගෙවූ බවත්, ඉන් පසු මෙම ණය මුදල කපා හරින බව පැවසූ නිසා ගෙවීම සිදු නොකල බවත් ප්‍රකාශ කරන ලදී. එබැවින් ගරු සභාපතිතුමාගේ අදහස් දැක්වීමේදී සටහන්ව ඇති අදූරදර්ශි පාලනය යන වචනය ඉවත් කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තාව සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- 2017 වර්ෂය සඳහා පැවැත්වූ වාර්ෂික වාර්තාව හා ගිණුම් සඳහා වන සම්මාන උළෙලේ දී ශ්‍රී ලංකාවේ නගර සභා අතරින් හොඳම වාර්ෂික වාර්තාව හා ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම වෙනුවෙන් බළන්ගොඩ නගර සභාව සම්මාන හිමි කර ගත් බව පැවසීය.
- නගර සභා දැක්ම සඳහා යෝජනා ලබා ගැනීමේ අවසාන දිනය 2019/11/14 වන බව ගරු සභාව දැනුවත් කරන ලදී.
- RA /06/2018 මැටල් කොරි ඉඩම් නඩුව නිශ්ප්‍රභා වූ නඩු පිටපත ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී. නැවත වරක් මෙම නඩුව ගොනු ගත නොකරන ලෙස සභාවේ මතය විය.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම.**

- ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අසනීප බැවින් නිවාඩු ලබා දෙන ලෙස ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් එතුමාගේ නිවාඩු අනුමත කරන බව සභාව දැනුවත් කරන ලදී.
- නන්දන ස්ටෝර්ස්, කිරිඳිගල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එම්.ඒ.සුගතපාල නාරන්ගොඩ මහතා විසින් බළන්ගොඩ කිරිඳිගල තොසිල ගාර්ඩන්ස් යන ලිපිනයෙහි පදිංචි ඩග්ලස් අයිටස් ද සිල්වා මහතාගේ නිවසේ මළ අපද්‍රව්‍ය කාණුවක් නොමැති වීම නිසා තමන් යන අඩි පාරට වැටී දුර්ගන්ධය හමන බැවින් පැතිරී යන ඩෙංගු වසන්ගතයෙන් බේරා දෙන ලෙස ඉල්ලමින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- 339/32, අක්කර 18, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ඉෂානි උපේක්ෂිකා නානායක්කාර මහත්මිය විසින් තම ඉඩම පහළින් වතුර කාණුවක් හා කුඹුර පිහිටා ඇති අතර එම වතුර කාණුවට අක්කර 18 ගමේ විශාල ජල ප්‍රමාණයක් යන බැවින් තම ඉඩමේ මායිම විශාල වශයෙන් ඛාදනය වී ඇති බැවින් තම නිවසට අලාභ හානියක් වීමට පෙර හැකි උපකාරයක් කර දෙන ලෙස ඉල්ලන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

**04.සභාව සතු දැන්වීම් පුවරු දහය වර්ෂයක කාලයට බදු දීම සඳහා ගැනුම්කරුවෙකු තෝරා ගැනීම.**

සභාව සතු දැන්වීම් පුවරු දහය, වර්ෂයක කාලයට බදු දීම සඳහා ගැනුම්කරුවෙකු තෝරා ගැනීමට ටෙන්ඩර් පත් විවෘත කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කර ගන්නා ලදී.

2019-11-15 සිට 2020-11-14 දක්වා වර්ෂයක කාලයකට සභාව සතු දැන්වීම් පුවරු දහය බදු දීම සඳහා එක් ලංසුපතක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි. එහි ලංසුව ලෙස විජනත් කුඹුර, රාස්සගල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ඒ.කේ.විමලනාථ මහතා රු.2,365.00 ක මුදලක් දක්වා තිබූ අතර එම ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහත තීරණය ගරු සභාපතිතුමා විසින් නැවත සභාවට ඉදිරිපත් කරමින් සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට කළ යෝජනාව ගරු

නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 05. කල් දී ඇති ප්‍රශ්න

### *05:01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා*

05:01:01 2018 වර්ෂයේ සහ 2019 වර්ෂයේ ඔක්තෝම්බර් මස දක්වා කාලය තුළ එක් එක් කොට්ඨාසවල සංවර්ධන කටයුතු සඳහා යෙදවූ ප්‍රතිපාදන පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

| කොට්ඨාශය | 2018 වර්ෂය | 2019 වර්ෂයේ ඔක්තෝම්බර් මාසය දක්වා |
|---|---|---|
| කුමාරගම | රු.120,000.00 | රු.500,000.00 |
| ඇල්ලෙපොල | රු.400,000.00 | රු.300,000.00 |
| බළන්ගොඩ නගරය | රු.5,139,897.28 | රු.646,000.00 |
| බළන්ගොඩ වසම | රු.518,505.00 | රු.300,000.00 |
| කිරිඳිගල | රු.720,436.00 | රු.1,480,000.00 |
| හුනුකුඹුර | රු.800,000.00 | - |
| තුඹගොඩ | රු.400,000.00 | රු.248,000.00 |
| බුලත්ගම | රු.400,000.00 | රු.176,000.00 |
| දෙහිගස්තලාව | රු.1,343,000.00 | රු.1,413,000.00 |
| ඕලුගංතොට | රු.371,000.00 | රු.515,000.00 |

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා අදහස් දක්වමින් දෙහිගස්තලාව කොට්ඨාසයේ සංවර්ධනය කළ කර්මාන්ත පිළිබඳ විස්තර විමසූ අතර දෙහිගස්තලාව කොට්ඨාසය සඳහා සභා අරමුදල් කිසිවක් යොදවා නොමැති බව පැවසීය. එමෙන්ම යම් කොට්ඨාශයක සංවර්ධන කටයුත්තක් සිදු කරන විට ඒ සම්බන්ධව අදාල කොට්ඨාසයේ මන්ත්‍රීවරයා දැනුවත් කරන ලෙසත් එක් එක් කොට්ඨාස සඳහා සභා අරමුදල් යොදනු ලබන ආකාරය පිළිබඳව විස්තරාත්මකව සභාවට ඉදිරිපත් කරන ලෙසත් පවසා සිටින ලදී.

## 06. කල් දී ඇති යෝජනා

### 06.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා

06:01:01 සරස්වතී පාර සුසාන ගෙය අලුත්වැඩියා කිරීම.

සරස්වතී පාර සුසාන ගෙය අලුත්වැඩියා කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 බැංකියවත්ත ගලි ප්‍රතිකාරක පද්ධතිය පුළුල් කර නව පෙරණයක් ඉදි කිරීම සඳහා බළන්ගොඩ නගර වසම එකමුතු ජ්‍යෝෂ්ඨ පුරවැසි සමිතිය වෙත ලබා දීම.

බැංකියවත්ත ගලි ප්‍රතිකාරක පද්ධතිය පුළුල් කර නව පෙරණයක් ඉදි කිරීම සඳහා බළන්ගොඩ නගර වසම එකමුතු ජ්‍යෝෂ්ඨ පුරවැසි සමිතිය වෙත ලබා දීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් මෙම කර්මාන්තය සඳහා වැය වන මුදල හා බැහැර කල හැකි ගලි ලෝඩ් ප්‍රමාණය පිළිබඳව විමසන ලදී.

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා මේ සඳහා රු.500,000.00 ක මුදලක් වැය වන බවත්, මේ සඳහා ගලි ලෝඩ් තුනක් බැහැර කල හැකි බවත් පවසන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කරන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, බළන්ගොඩ නගර වසම එකමුතු ජ්‍යෝෂ්ඨ පුරවැසි සමිතිය මඟින් ඉටු කරන ලද කරව්කැටිය මාර්ගයේ කොන්ක්‍රීට් ස්ලැබ් දැමීමේ කර්මාන්තය අසාර්ථක වූ බැවින් මෙම කර්මාන්තය ඉහත සමිතිය වෙත ලබා දීම සඳහා තම විරෝධතාවය ප්‍රකාශ කර සිටින ලදී.

එබැවින් ඉහත කර්මාන්තය බළන්ගොඩ එක්සත් මිතුරු සංසඳය වෙත ලබාදීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 දෙහිගස්තලාව කුමාරගම මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු කිරීම ශ්‍රී මුතු සුභ සාධක සමිතිය වෙත ලබාදීම.

දෙහිගස්තලාව කුමාරගම මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු කිරීම ශ්‍රී මුතු සුභ සාධක සමිතිය වෙත ලබාදීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ04 2020 වර්ෂයට අදාල සාප්පු කඩ, පදික කඩ, මැණික් කඩ, විවෘත කඩ, පොදු වෙළෙඳසැල එළවළු හා සිල්ලර කඩ, මස් කඩ, නව බස්නැවතුම්පල කඩ කාමර, සම්පත් පියසට යාබද කඩ කාමරය, සතිපොළ කඩ කාමර, මහජන පොළ කඩ, පොළ ගබඩා, සති පොළ ආපන ශාලාව, බස්නැවතුම්පල යාබද පදික කඩ, පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම හා රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමට අදාල ගිවිසුම් කෙටුම්පත් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

2020 වර්ෂය සඳහා ඉහත සඳහන් ගිවිසුම් කෙටුම්පත් සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා නැවත වරක් අදහස් දක්වමින් " බස්නැවතුම්පල යාබද ඉඩම් කොටස බදු දීම" යන ගිවිසුම කුමන ස්ථානය සඳහා අත්සන් කරනවාද යන්න විමසා සිටි අවස්ථාවේදී ගරු සභාපතිතුමන් විසින් පවසා සිටියේ ලංකා බැංකුව ඉදිරිපිට කඩ කාමර සඳහා එම ගිවිසුම අත්සන් කරන බවයි. එබැවින් එය ගරු සභාපතිතුමා පවසන ආකාරයට වෙනස් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ05 2019 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම හා ඒ සඳහා සභිකයන් දෙදෙනෙකු පත් කිරීම.

2019 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම හා ඒ සඳහා සභිකයන් දෙදෙනෙකු පත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2019 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස පහත නම් සඳහන් නිළධාරීන් පත් කිරීමටත්,

- සභාපති ප්‍රධාන කළමනාකරණ සහකාර, ජී. ඩී. ඒ. සේමපාල මිය
- සාමාජික සංවර්ධන නිළධාරී, ඒ. රජිත කොස්වත්ත මයා
- සාමාජික සංවර්ධන නිළධාරී, ඩී.ඩී. සුජාතා නීලකාන්ති මිය
- සාමාජික කළමනාකරණ සහකාර, ඩබ්. එස්. මෙනේරිවත්ත මිය
- සාමාජික කළමනාකරණ සහකාර, ප්‍රිතිකා ඩී උක්වත්ත මිය
- සාමාජික සංවර්ධන නිළධාරී, චතුලියා කල්හාරි දෙණිපිටිය මිය
- සාමාජික සංවර්ධන නිළධාරී,නයනී යසවර්ධන මිය
- සාමාජික සංවර්ධන නිළධාරී, රසිකා මීගස්දෙණිය

- ❖ සාමාජික සංවර්ධන නිළධාරි ක්‍රිෂාණි අනුරුද්ධිකා මිය
- ❖ සාමාජික කළමනාකරණ සහකාර සජිත් ශානක මයා
- ❖ සාමාජික සංවර්ධන නිළධාරි දීපා ප්‍රභාෂිණි රණසිංහ මිය
- ❖ අධීක්ෂණය ගණකාධිකාරි, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා

මහජන පුස්තකාලයේ පොත් සමීක්ෂණය සඳහා පුස්තකාලයාධිපති සහ එහි කාර්යය මණ්ඩලය සහභාගී කරවීමටත්, අධීක්ෂණ මන්ත්‍රීවරු ලෙස ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා පත් කිරීමටත් තීරණය විය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ06 2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ නාම ලේඛනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ නාම ලේඛනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ07 කාර් පාර්ක් අංක 20 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම.

කාර් පාර්ක් අංක 20 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙහි වර්ථමාන බදුකරු වන ටී.පී.ජෙනට් සිසිල්ඩා විසින් හෂාන් අනූෂ ප්‍රියනාත් යන අය වෙත අතුරු බදු ලබා දී ඇති බව අනාවරණය වී ඇති අතර මෙම කාඩ කාමරය සඳහා කී මනි මුදලක් ලබා ගෙන නොමැති බැවින් ප.පා.කො.චක්‍රලේඛ 01/2009 ප්‍රකාරව කටයුතු කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී. එබැවින් වර්තමාන තක්සේරු මුදල මත පදනම්ව කීමනි මුදල ගණනය කර ඉන් 25% ක මුදලක් අය කර අතුරු බදුකරු වන හෂාන් අනූෂ ප්‍රියනාත් යන අය වෙත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ08 බිම්කට්ටි සැලසුම් ශිල්පීන් හා ගොඩනැගිලි සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

බිම්කට්ටි සැලසුම් ශිල්පීන් හා ගොඩනැගිලි සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ09 පුස්වැල්කැටිය මාර්ගය පළමු පටුමඟ සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

පුස්වැල් කැටිය මාර්ගය පළමු පටුමඟ සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා වන යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා සභා අරමුදල් නොයොදවා වෙනත් අරමුදලක් මගින් මෙම කර්මාන්තය සිදු කරන ලෙසත්, අරමුදල් ලැබුණු පසු ඒ සඳහා නැවත සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06ඃ01ඃ10 මුල්ගෙදර වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

මුල්ගෙදර වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා සභා අරමුදල් නොයොදවා වෙනත් අරමුදලක් මගින් මෙම කර්මාන්තය සිදු කරන ලෙසත්, අරමුදල් ලැබුණු පසු ඒ සඳහා නැවත සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**07. මන්ත්‍රි යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

07:01:01 මේ දිනවල පවතින අධික වර්ෂාව හේතුවෙන් පාර දෙපසේ වල් පැළැටි වර්ධනය වීම නිසා ගමනාගමනයේ දී මිනිසුන්ට එය බාධාවක් වී ඇති බැවින් පුරණ ගෙදර පාර, කරදියමුල්ල පාර, ඇල්ලෙඅරාව, කිරිඳිගල යන ප්‍රදේශ සුද්ධ පවිත්‍ර කිරීම.

07:01:02 ඕලුගංතොට පොදු සුසාන භූමියට ජලය ලබා ගෙන ඇති නමුත් මේ වන විට එයට ජලය ලබා දීම අත්හිටුවා ඇත .එම නිසා එම ජල බිල්පත සඳහා මින් ඉදිරියට මුදල් වෙන් කිරීම.

07:01:03 පොදු සුසාන භූමියේ ඇති ගොඩනැගිල්ලට යකඩින් දොරවල් දෙකක් සවි කිරීම.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ඉදිරිපත් කළ ඉහත යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා මේ දිනවල පවතින වැසි තත්ත්වය හේතුවෙන් ගස්වල අතු මාර්ගයට කඩා වැටී ඇති බවත්, එම නිසා පාසල් දරුවන්ට පවා මාර්ගයේ ගමන් කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවත් සඳහන් කළ අතර පුරණ ගෙදර පාර, කරදියමුල්ල පාර, ඇල්ලෙඅරාව, කිරිඳිගල යන ප්‍රදේශ සුද්ධ පවිත්‍ර කර දෙන ලෙස පවසා සිටින ලදී.

එමෙන්ම ඕලුගංතොට පොදු සුසාන භූමිය සඳහා වන ජල බිල්පත නොගෙවීම හේතුවෙන් මේ වන විට ජල සැපයීම අත්හිටුවා ඇති නිසා එම ජල බිල්පත සඳහා මින් ඉදිරියට සභාවෙන් මුදල් වෙන් කරන ලෙස පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් මෙම ජල බිල්ත සඳහා හිඟ මුදල් ගෙවීමට නොහැකි අතර පෞද්ගලික නමකට සඳහා බිල්පත පවතීනම් එහි නම නගර සභාව නමට වෙනස් කර ගත යුතු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:02:01 වැවවත්ත උද්‍යානයේ කාණු පද්ධතිය නිසි ආකාරයට නඩත්තු නොකිරීම හේතුවෙන් ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමේ අවදානම පිළිබඳ සභාවේ අවධානය යොමු කිරීම.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉදිරිපත් කළ ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් වැවේවත්ත උද්‍යානයේ කාණු පද්ධතිය සකස් කිරීමේ සංවර්ධන කටයුත්ත සභාව විසින් අතරමග නවතා දැමීම නිසා එම ස්ථාන වල ජලය පිරී ඩෙංගු මදුරුවන් බෝ වී ඇති බැවින් මෙහි සම්පූර්ණ වගකීම සභාව විසින් භාර ගත යුතු බව පවසා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

07:03:01 හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයේ "කෝපිවත්ත" නමින් දී තිබූ නාම පුවරුව අබලන් වී ඇති බැවින් එය ප්‍රතිසංස්කරණය කිරීම.

07:03:02 2019/10/26 දිනට ආසන්න දිනකදී ගරු ලේකම්තුමියගේ අධීක්ෂණයට ලක් වූ දොරවෙල ඔය සිට හුණුකුඹුර පාර දක්වා වූ පාර වල් බිහි වී ඇති බැවින් එය නැවතත් මහජනතාවට පරිහරණය කිරීමට හැකි පරිදි කටයුතු සලසා දීම.

ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත යෝජනා ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අවුරුදු දෙකක් පමණ කාලයක සිට මෙම පුවරුව අබලන් වී ඇති අතර ජනාධිපතිවරණය හේතුවෙන් පෝස්ටර් ගැසීම නිසා මෙය දැන්වීම් පුවරුවක් බවට අද වන විට පත් වී ඇති බැවින් හැකි ඉක්මනින් මෙම නාම පුවරුව ප්‍රතිසංස්කරණය කරන ලෙස ඉල්ලා සිටින ලදී.

එමෙන්ම දොරවෙල ඔය සිට හුණුකුඹුර පාර දක්වා වූ පාර වල් බිහි වී ඇති බැවින් එය නැවතත් මහජනතාවට පරිහරණය කිරීමට හැකි පරිදි කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

07:04:01 මාර්ග තෝරා වෙන් කර ගැනීමට පහසු වන සේ අංක වශයෙන් වෙන්කර දීම.

**කරව්කැටිය මාර්ගය**

1 වන පටුමග - (චාමර ගෙස්ට් පාර)
2 වන පටුමග - (සොනික් ස්ටුඩියෝ සහ රාජා මහතාගේ ගෙවල් ළඟ පාර)
3 වන පටුමග - (කරුණාරත්න ප්‍රින්ටර්ස් සහ මනතුංග මහතාගේ ගෙවල් පිහිටි පාර)
විධායක ඉංජිනේරු කාර්යාල පාර
සී.සී.දෙමළ විද්‍යාලය පාර
4 වන පටුමග - (ෆාස්ටර්/බණ්ඩාර මහතාගේ (ගෝමස්), මුරලිගේ ගෙවල් පිහිටි පාර)
මහමෙවුනා පාර

5 වන පටුමග - (පල්ලිය/ ගොබිකාස් ගාමන්ට්,රාජා/සම්පත් මහතාගේ ගෙවල් පිහිටි පාර)
උඩකන්ද පාර
ගල්වල පාර
6 වන පටුමග - (සීබිල්ස් අයිතිකරුගේ නිවස පිහිටි පාර)
7 වන පටුමග - (දලං බණ්ඩාර මහතාගේ නිවස පිහිටි පාර)
8 වන පටුමග - (උඩවත්ත මහතාගේ නිවස පිහිටි පාර)
කොටු ගොඩැල්ල පාර

**කොටු ගොඩැල්ල පාර (බෝම්බුව පාරෙන් උඩට වමට හැරී යා යුතුය)**

1 වන පටුමග - (යශෝධා/ ජයන්ති ස්ටෝර්ස්/දංගමුව වලව්ව පිහිටි පාර)
2 වන පටුමග - (රංජි/අර්ජුන/වික්‍රම/සමන් මහතාගේ ගෙවල් පිහිටි පාර)
බලකොටුව පාර - (අනුර සර්/TO මහතා/හා ඩොක්ටර්ගේ නිවස පිහිටි පාර)
කොටුගොඩැල්ල පාර

**සිටි ගාඩන් මාර්ගය**

පළවන පටුමග - (වෙද ගෙදර/කථිකාචාර්යතුමා,සෙනෙවිරත්න සර්ගේ නිවස පාර)

ඉහත මාර්ග, පටුමග යනුවෙන් නම්කර වෙන් කිරීම සඳහා එම මාර්ග වල සියලුම පදිංචිකරුවන්ගේ කැමැත්ත ඇති බව සහතික කරමි.

07:04:02 කොටු ගොඩැල්ල මාර්ගය 2 වන පටුමග (අර්ජුන/රංජි/සමන්/වික්‍රමසිංහ මහතාගේ ගෙවල් වලට යන පාර) වලවල් වසා නඩත්තු කටයුතු කර දීම.

07:04:03 කොටු ගොඩැල්ල මාර්ගය 1 වන පටුමග (යශෝධා/ ජයන්ති ස්ටෝර්ස්/දංගමුව වලව්ව පිහිටි පාර) වලවල් වසා දමා නඩත්තු කටයුතු කර දීම.

07:04:04 කොටුගොඩැල්ල මාර්ගයේ "බලකොටුව මාවත" වලවල් වසා නඩත්තු කටයුතු කර දීම.

07:04:05 "බාන්ස් රත්වත්ත " මාවතේ "රන්දිලු ගෙස්ට්" පාර, කොන්ක්‍රීට් කර නොමැති අඩි 30 ක පමණ වූ ඉතිරි කොටස කොන්ක්‍රීට් කර දීම

07ඃ04ඃ06 දෙවට පාරින් හැරී මල්ලිකා මහත්මියගේ සහ තවත් ගෙවල් කිහිපයක් ඇති කුඩා පාර පයින් යා හැකි මට්ටමට සංවර්ධනය කර දීම.

07ඃ04ඃ07 මහජන ක්‍රීඩාංගණය අවට පිරිසිදු කර සංවර්ධනය කර දීම.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් මාර්ගයන්, පටුමග ලෙස නම් කර වෙන් කර දීම දියුණු වන නගරයක ලක්ෂණයක් බව පවසන ලදී.

එමෙන්ම කොටුගොඩැල්ල මාර්ගය 1 වන පටුමගෙහි කාණුවක් නොමැති නිසා ජලය මාර්ගයෙහි ගලා යන බවත්, මෙම මාර්ගය ශුද්ධ පවිත්‍ර වී ඇති බැවින් එහි කාණු පද්ධතිය සකස් කර දෙන ලෙසත් පවසා සිටින ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් කොටුගොඩැල්ල මාර්ගයේ "බලකොටුව මාවත" වලවල් වසා නඩත්තු කටයුතු කර දෙන ලෙසත්, "බාන්ස් රත්වත්ත " මාවතේ "රන්දිලූ ගෙස්ට්" පාර කොන්ක්‍රීට් කර නොමැති අඩි 30 ක් පමණ වන ඉතිරි කොටස කොන්ක්‍රීට් කර දෙන ලෙසත් පවසන ලදී.

එමෙන්ම දෙවට පාරින් හැරී මල්ලිකා මහත්මියගේ සහ තවත් ගෙවල් කිහිපයකට ප්‍රවේශ වීමට ඇති කුඩා පාර පයින් යා හැකි මට්ටමට සංවර්ධනය කර දෙන ලෙසත්, මහජන ක්‍රීඩාංගණය අවට පිරිසිදු කර සංවර්ධනය කර දෙන ලෙසත් පවසා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. හදිසි යෝජනා**

08ඃ01 සම්පත් පියසට යාබද කඩ කාමරයෙහි කඩ කුලිය වැඩි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

සම්පත් පියසට යාබද කඩ කාමරයෙහි කඩ කුලිය වැඩි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී අදහස් ඉදිරිපත් කල ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සම්පත් පියසට යාබද කාමරය බදු ගැනුම්කරුට ලබා දුන්නේ කෙසේදැයි විමසා සිටින ලදී.

එහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ කොමසාරිස් පාලනය පැවති සමයේදී ගැනුම්කරු විසින් කඩ කුලී නොගෙවීම මත කඩ කාමරය පවරා ගෙන වර්තමාන ගැනුම්කරුගේ ඉල්ලීම මත ඔහුට ලබා දුන් බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් තමා සිටි සමයේදී මෙම කඩ කාමරය කැඳ විකිණීම සඳහා ලබා දුන් අතර කොමසාරිස් පාලනය පැවති සමයේදී කඩ කුලී නොගෙවීම මත සභාව විසින් මෙම කඩ කාමරය පවරා ගෙන වර්තමාන පුද්ගලයාට ලබා දී ඇති බව පවසන ලදී.

එබැවින් මෙම කඩ කාමරය ටෙන්ඩර් කර ලබා දීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් තම විරෝධතාවය ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී ගරු සභාපතිතුමා මෙම කඩ කාමරයේ කැඳ විකිණීම සිදු කළ පුද්ගලයා මේ වන විට වෙනත් ව්‍යාපාරයක් සිදු කරමින් සිටින නිසා 10% ක ගාස්තුවක් වැඩි කර වර්තමාන ගැනුම්කරු සඳහාම ලබා දීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් රු.3,000.00 ගාස්තුවක් අය කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින්, වැට් හා ජාතික ගොඩනැගීමේ බද්ද සමග රු. 3000.00 මුදලක් අය කිරීම සුදුසු බව පවසන ලදුව **විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.09.19 දින හා 2019.10.04 දින පැවති මුදල් කමිටු වාර්තා ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

09. **ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 15,204,641.07 |
| වෙනත් ලැබීම් | 1,805,836.84 |
| මුලු ලැබීම් | 17,010,477.91 |
| පුනරාවර්තන වියදම් | 9,555,532.77 |
| වෙනත් වියදම් | 2,057,407.48 |
| මුලු වියදම් | 11,612,940.25 |

2019-10-01 දින සිට 2019-10-31 දක්වා

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 226-7521 | 15,600.00 |
| 227-5020 | 54,636.00 |
| | 570.00 |
| | 570.00 |
| RD - 8240 | 26,520.00 |
| ZA -0228 | 10,192.00 |
| 56-1906 | 17,954.56 |
| BC-0005 | 52,000.00 |
| DDR-0008 | 1,040.00 |
| GC 0001 | 13,440.00 |
| LL - 7688 | 8,320.00 |
| HF - 8558 | 18,995.00 |
| GK-1483 | 11,354.00 |
| GK-6227 | 19,796.00 |
| | 269.00 |
| JD-4684 | 2,740.00 |
| LL-2110 | 13,817.00 |
| ND-5124 | 40,425.84 |
| DPP-0006 | 2,877.00 |
| OS0006 | |
| PF-4006 | 37,461.60 |
| QL-2901 | 5,480.00 |
| RC-1107 | 4,160.00 |
| RC-1118 | 30,160.00 |
| RC-8183 | 30,955.00 |
| RE-2600 | 28,080.00 |

| | |
|---|---|
| UQ - 1933 | 2,740.00 |
| VI - 1833 | 1,096.00 |
| HF-7899 | 14,640.52 |
| | 23,020.00 |
| YG-0758 | 2,055.00 |
| ZA - 5039 | 59,730.00 |
| **එකතුව** | **550,694.52** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**<u>ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් හරක් මස් කඩ ටෙන්ඩර් කිරීම පිළිබඳ වර්තමාන තත්ත්වය කෙසේදැයි විමසීය. එයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ පුවත්පත් දැන්වීම් සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් මාළු කඩ ටෙන්ඩර් කිරීම පිළිබඳ තීරණයක් ලබා ගත් පසු එම කඩ කාමර වර්ග දෙකම එක වරම ටෙන්ඩර් කිරීමට කටයුතු කර ලබන සභා වාරයේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවයි.

එමෙන්ම ගණකාධිකාරිතුමා මෙම සභාවට පැමිණි දා සිට විධිමත් අයවැය ලේඛනයක් ඉදිරිපත් වූ බැවින් එතුමාගේ පෞද්ගලික ලිපිගොනුවට විස්තරාත්මක ප්‍රශංසා ලිපියක් ඇතුලත් කරන ලෙස පවසන ලදී.

2019 වර්ෂය සඳහා කිසිදු මන්ත්‍රී ප්‍රතිපාදනයක් නොලැබුණු බැවින් වැසිකිලි ආධාර ලබා දීම ඉක්මනින් සිදු කිරීමට කටයුතු සලසන ලෙස පැවසූ අතර ප්‍රමාදයක් සිදු වන්නේනම් අදාළ අයට ඉදිකිරීමට අවස්ථාව ලබා දී නගර සභාව මඟින් අධීක්ෂණ කටයුතු සිදු කරන ලෙස පවසා සිටින ලදී.

එමෙන්ම බළන්ගොඩ මූලික රෝහලේ වෛද්‍යවරු දස දෙනෙකුට පමණ ඩෙංගු රෝගය වැළඳී ඇති අතර බළන්ගොඩ මූලික රෝහල සඳහා ධූමායන කටයුතු සිදු කළ ද එහි ප්‍රයෝජනයක් නොමැති බැවින් Solfex රසායනික ද්‍රව්‍ය යෙදීමට කටයුතු කරන ලෙස පවසන ලදි.

එමෙන්ම වැවේවත්ත ප්‍රදේශයේ අතරමඟ නවතා තිබෙන කාණුව සකස් කිරීමේ සංවර්ධන කටයුත්ත හැකි ඉක්මනින් අවසන් කරන ලෙස පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් ඕලුගංතොට ඇල්ෆාවත්ත මාර්ගය නඩත්තු කිරීමේ කටයුතුවල වර්තමාන තත්ත්වය කෙසේදැයි විමසා සිටින ලදී.

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා මේ දිනවල පවතින වර්ෂාපතනය හේතුවෙන් නඩත්තු කටයුතු කිසිවක් ඉටු කිරීමට නොහැකි වූ බැවින් ඉදිරියේදී මෙම සංවර්ධන කටයුතු සිදු කරන බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් නඩු තීන්දුව මඟින් ශුද්ධ කිරීම සඳහා සභාවට බලය පවරා ඇති හුණු කුඹුර පාරේ කාණුව ඉක්මනින් පිළිසකර කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී. එමෙන්ම තුඹගොඩ අඩි 20 ක පමණ ප්‍රමාණයක් ස්ලැබ් යොදා නොමැති බැවින් විවෘත කාණුව තුළ යෝගට් කෝප්ප ආදිය දකින්නට ලැබෙන අතර මේ නිසා මදුරුවන් බෝ වීමේ ප්‍රවණතාවයක් පවතින බැවින් එම ස්ථානය කොන්ක්‍රීට් ස්ලැබ් යොදා ආවරණය කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනි එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනි එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද සරස්වතී පාර සුසාන ගෙය අලුත්වැඩියා කිරීමේ යෝජනාව හැකි ඉක්මනින් සිදු කරන ලෙසත් එය ඉටු කිරීමේදී තමාව දැනුවත් කරන ලෙසත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය දඹගහ නිවස අසල අඹ ගස කපා ඉවත් කිරීමේ තත්ත්වය හා මුගුණමලේ සුසාන භූමිය නගර සභාව වෙත පවරා ගැනීමේ තත්ත්වය කෙසේදැයි විමසා සිටින ලදී.

එමෙන්ම පසුගිය සභා වාරයේ දී ඉදිරිපත් කල කිරිඳිගල සිට දොරවෙල දක්වා පාරේ සිටුවා ඇති විදුලි කණු ඉවත් කිරීමේ කටයුත්තෙහි තත්ත්වය කෙසේදැයි විමසා සිටින ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය නව පොදු වෙළෙඳසැල ඉදිකිරීම ඉක්මනින් සිදු කරන්නේ දැයි විමසූ අතර එසේ ඉදිකිරීමේදී වර්තමානයේ පොදු වෙළෙඳසැලේ වෙළෙඳාම් කරන පුද්ගලයන් සඳහා තාවකාලික ස්ථානයක් ලබා දීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා ප.ව.12.30 ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී.**

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා මුගුණමලේ සුසාන භූමිය නගර සභාව වෙත පවරාගැනීම සඳහා අවශ්‍ය මුදල් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ගෙවා ඇති බවත්, කිරිඳිගල සිට දොරවෙල දක්වා පාරේ සිටුවා ඇති විදුලි කණු ඉවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස විදුලි බල මණ්ඩලය දැනුවත් කර ඇති බවත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා ප.ව.12.33 ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී.**

**<u>ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් අවමංගල්‍යයන් වෙනුවෙන් ප්‍රදර්ශනය කරන බැනර් ඔරලෝසු කණුව අවට ප්‍රදේශයේ ප්‍රදර්ෂනය කිරීමට අවස්ථාව සලසා දෙන ලෙසත් මහමෙවුනා මාවතේ එකදු විදුලි පහනක්වත් නොමැති බැවින් හැකි ඉක්මනින් විදුලි පහන් සවි කිරීම සිදු කර දෙන ලෙසත් පවසන ලදී.

පොදු වෙළෙඳසැල අසළ මහජන ක්‍රීඩාංගණයට ඇතුල්වන ස්ථානයේ මාර්ගයේ ඇති ගැට්ට හේතුවෙන් වාහන තදබදයක් පවතින බැවින් එම ගැට්ට කඩා ඉවත් කරන ලෙස හෝ එසේ නොමැතිනම් එහි උස ප්‍රමාණය අඩු කරන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ප.ව.12.45 ට පමණ සභාවෙන් පිටව යන ලදී.**

එමෙන්ම ට්‍රැක්ටර් ගමන් කිරීමට නොහැකි මාර්ගයන්හි කුණු කසළ එකතු කිරීම සඳහා Truck රථයක් මිලදී ගැනීමේ තත්ත්වය කුමක්දැයි විමසන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් ඔරලෝසු කණුව අසල දැන්වීම් පුවරුවක් සවි කරන බවත් ක්‍රීඩාංගණය අසල මාර්ගයේ වාහන වේගයෙන් ගමන් කරන බැවින් එම ගැට්ට යොදා ඇති බවත් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය ප.ව.01.00 ට පමණ සභාවෙන් පිටව යන ලදී.**

**<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා සංශෝධනයන් ලෙස " පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් යටතේ පෙන්වා දෙන කරුණු" යන වාර්තාවේ අදාල සභාව පැවැත්වූ දිනය සටහන් කරන ලෙසත්, සඳුන්ගම මාර්ගය අබලන් වී ඇති බැවින් එය පිලිසකර කර දෙන ලෙසත්, එම මාර්ගයේ කාණු පද්ධතිය හා විදුලි ප්‍රශ්න තිබෙන බැවින් ඒවා පිළිබඳවද අවධානය යොමු කරවන ලෙස ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා පැවසූ බවට සටහන් වී ඇති නමුත් එහි ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිගේ නම සඳහන් විය යුතු බව පවසන ලදී.

එමෙන්ම කිවුලවෙල පදිංචි ආර්.කේ.ගුණපාල මහතාට පදික කඩයක් ලබාදීම පිළිබඳ අවධානය යොමු කරන ලෙස පවසන ලදී.

අද වන විට දේශපාලනික වශයෙන් ගත්ත ද රාජ්‍ය ආයතනයකට ගියද රට තුළ පැහැදිලි බලයක් තිබෙන ආණ්ඩුවක් නොමැති වීම නිසා රටේ අර්බුදකාරී තත්ත්වයක් පැන නැගී ඇති බවත් එමෙන්ම පළාත් සභා මැතිවරණය නොපැවැත්වීම නිසා විශාල ගැටළු රාශියක් ඇති වී තිබෙන බවත් පවසන ලදී. සමහර පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන් සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දීම සඳහා සුදුසු ක්‍රමවේදයක් නොමැති වීම නිසා මහජනතාව අපේක්ෂා කරන ප්‍රතිලාභ ලබා දීමට නොහැකි වී ඇති බව පවසා සිටින ලදී.

දේශපාලනයේ සදා කාලික හතුරෝද සදා කාලික මිතුරෝද නොමැති යැයි පවසමින් ලබන සභාව නව ජනාධිපතිවරයෙක් යටතේ පවත්වන බවත් බළන්ගොඩ නගර සභාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් තිදෙනා පොදු ජන පෙරමුණේ විශ්වාසය දිනා ගනිමින් තම පක්ෂය සමඟ එකතු වීම පිළිබඳව ඔවුන්ට ස්තුතිවන්ත වන නමුත් අනෙකුත් පළාත් පාලන ආයතනවල එසේ සිදු නොකර වෙනත් තීරණ ගැනීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කර සිටින බව පවසා සිටින ලදී.

තමා නගර සභාවේ සභිකයෙකු වශයෙන් අඛණ්ඩව අවුරුදු 22ක් අපරාජිතව සිටි බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා රටේ තීරණාත්මක මැතිවරණයක් වන ජනාධිපතිවරණය පැවැත්වීම සඳහා තව දින කිහිපයක් පමණක් පවතින බවත් එම මැතිවරණයෙන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වන බවට තම මන්ත්‍රී ධූරය අභියෝගයට ලක් කරන බව පැවසීය. එසේ නොමැතිව සජිත් ප්‍රේමදාස මැතිතුමා ජයග්‍රහණය කළහොත් තමා ලබන සභා වාරයේ දී සිය මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වන බව ද එසේ නොමැතිව ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හැර වෙනත් අයකු දිනන බවට කවුරුන් හෝ මෙම අභියෝගය භාර ගන්නේනම් එම අභියෝගය භාර ගන්නා පුද්ගලයාද තම මන්ත්‍රී ධූරය හැර යා යුතු බව ද පවසන ලදී.

කුමන්ත්‍රණය කරන්නේ කවුද, රටට අවශ්‍ය නායකයා කවුද, රටට ජාතියට ආදරය කවුද, යන්න ජනතාව තීන්දු කර අවසන් බැවින් නොවැම්බර් 17 වන දිනට එය දැන ගත හැකි බවත්, මෙම අභියෝගය කවුරුන් හෝ භාර ගන්නේ නම් තමා වගකීමෙන් මෙම අභියෝගය භාර ගන්නා බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු උප සභාපති එම්.ටී.එම්.රුැමි මැතිතුමා</u>**

ගරු උප සභාපති එම්.ටී.එම්.රුැමි මැතිතුමා අදහස් දක්වමින් තමා මුස්ලිම් ජාතිකයෙකු වශයෙන් ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙකු වශයෙන් ද 2015 ජනාධිපතිවරණයට වඩා වෙනස් වාතාවරණයක් අද රටේ පවතින බව සඳහන් කළේය. එමෙන්ම එක්සත් ජාතික පක්ෂය මාධ්‍ය මඟින් ජාතිවාදය අවුස්සා මුස්ලිම් ඡන්ද ලබා ගත් අතර මුස්ලිම් ජනතාව තම ආගමට වඩා එක්සත් ජාතික පක්ෂයට ආදරය කළ නිසා තම ඡන්දය එම පක්ෂයට ලබා දුන් නමුත් අද ජනතාව ඊට වඩා බුද්ධිමත් බැවින් මුස්ලිම් ජනතාව 30%- 40% ක් අතර ප්‍රමාණයක් ද සිංහල ජනතාව 65%ක් පමණ ප්‍රමාණයක් ද ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ඡන්දය ලබා දෙන බව පවසන ලදී.

එබැවින් නොවැම්බර් 17 වන දින රටට ආදරය කරන, රට ආරක්ෂා කරන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වන බව ස්ථිර බව පැවසූ ගරු උපසභාපතිතුමා, රටේ සුරක්ෂිතතාවය හා මාතෘ භූමිය වෙනුවෙන් සියළු ජාතීන්ට එකට එක්ව ජීවත්විය හැකි රටක් නිර්මාණය කිරීමට හැකි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ජයග්‍රහණය ප්‍රාර්ථනා කරන අතරම පොදු ජන පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකට එක්ව ශක්තිමත් ගමනක් යන බව පවසන ලදී.

එමෙන්ම තමන් කිසි දිනක එක්සත් ජාතික පක්ෂය වෙත නොයන බව ද එසේ නොමැතිනම් තමා දේශපාලනයෙන් සමුගන්නා බව ද පවසන ලදී. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ බළන්ගොඩ ආසන සංවිධායක ගරු භාණු මුණිප්‍රිය මැතිතුමා තමන් එක්සත් ජාතික පක්ෂය වෙත නොයන බව මාධ්‍යයට ප්‍රකාශ කරන ලෙස පැවසූ බවත් එතුමා බළන්ගොඩ ආසනය තුළ පක්ෂය ආරක්ෂා කරමින් සිටින බවත් වගකීමෙන් ප්‍රකාශ කරන බව වැඩිදුරටත් පවසමින් නව ජනාධිපතිවරයෙක් හා නව රජයක් යටතේ නැවත මෙම සභාවට පැමිණීමට ලැබේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**11. අවසානය**

ගරු සභාපති තුමා අදහස් දක්වමින් අන් සියලු දෙනා දේශපාලනය ගැන කථා කළ ද තමන්ට සභාපති වශයෙන් දේශපාලනය ගැන කථා කිරීම වලංගු නොමැති නමුත් රටේ ජාතිවාදය ආගම්වාදය මෙන්ම ජාති භේදය හා ආගම්භේදය මුල්කර ගෙන ඥාණසාර හිමියන් බළන්ගොඩට ගෙන්වා ගනිමින් විශාල මුස්ලිම් ප්‍රජාවක් සිටින නගරයේ ප්‍රසිද්ධියේ ම මුස්ලිම්

කඩවලට නොයන ලෙස පවසමින් ව්‍යාපාර කරන බළන්ගොඩ ජනතාවට විශාල කරදරයක් පීඩනයක් කළේ කවුදැයි බළන්ගොඩ ජනතාව දන්නා බව පවසන ලදී.

පරාජිතයාගේ අවසාන තුරුම්පුව ජාතිවාදය හා ආගම්වාදය බව ද 2015 යහපාලන රජය රටට කිසිදු යහපතක් සිදු කර නොමැති බවට හිටපු නායකයෙක් මාධ්‍යයට ප්‍රකාශ කර ඇති බව ද පැවසූ ගරු සභාපතිතුමා, ඔහු වැඩිපුරම පන්සල් වල සිටින නිසා රජය කල සංවර්ධනයන් නොදැක ඇති නමුත් ගම්පෙරළිය යටතේ කෝටි 6000 කට අධික වැඩ කොටසක් ලංකාව පුරා සිදු කර ඇති බව සඳහන් කළේය. එමෙන්ම සසුනට අරුණ ව්‍යාපෘතිය යටතේ පන්සල් පල්ලි කෝවිල් සඳහා විශාල වැඩ කොටසක් කර ඇති බව ද මේ නිසා රටේ සංවර්ධනයක් සිදු වී නොමැති බව ප්‍රකාශ කිරීම වැරදි සහගත බව ද වැඩිදුරටත් පවසන ලදී. එදා ප්‍රචාරක කටයුතු සඳහා විශාල මුදලක් වැය කළ නමුත් මෙම රජය එවැනි වියදමක් සිදු කර නොමැති බැවින් ජනතාව එය නොදකින අතර ගමට ගියවිට සිදු කළ සංවර්ධනය දැක ගත හැකි බව පැවසීය.

එමෙන්ම බළන්ගොඩ සංවර්ධනය නොවූ පාරවල් අතරින් 80%ක ප්‍රමාණයක් ගම්පෙරළිය වැඩසටහන යටතේ සංවර්ධනය කළ බැවින් සංවර්ධනය සිදු නොකලායැයි පැවසීම සම්බන්ධව තමා සම්පූර්ණයෙන්ම විරුද්ධ වන බව පවසන ලදී. නව ජනාධිපතිවරයෙකු යටතේ ලබන සභාව පවත්වන අතර කුමන පුද්ගලයෙකු ජනාධිපති වුවද ඔහු රට තුළ සංවර්ධනයක් සිදු කරන, සියලු දෙනාට එක සේ සළකන සියලු රටවැසියා ගැන සිතන පුද්ගලයෙක් මෙන්ම සියලු ජාති ආගම් ගැන හිතන ලෙන්ගතු නායකයෙක් විය යුතු බව පැවසීය.

එළඹෙන මැතිවරණයෙන් පසුව සියලු දෙනා සුහද සිතින් යළි හමුවේවා යැයි පතමින් අද දින සභාවට සහභාගි වූ ගරු උප සභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පළකරමින් මෙදින සභාවේ වැඩ කටයුතු ප.ව.01.30 ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.